# කෘෂිකාර්මික ළිං ව්‍යාපෘතිය පිළිබඳව ගරු කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ ඇමතිතුමා සමග කරන ලද සාකච්ඡාවක්

**ප්‍රශ්නය :** **ගරු ඇමතිතුමනි, කෘෂිකාර්මික ළිං ඉදිකිරීමේ වැඩ සටහනේ ප්‍රධාන පරමාර්ථ පිළිබඳ හැඳින්වීමක් අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.**

**පිළිතුර :** වියළි කලාපයේ ගොවියෝ ජල හිඟය නිසා වගා කටයුතු කරගැනීමට නොහැකිව සිටිනවා. වියළි කලාපයේ කුඩා වැව් සිඳී යෑම මෙයට ප්‍රධාන හේතුව වී තිබෙනවා. එම හේතුව නිසා වගා කටයුතු කරගැනීමට නොහැකි ඉඩම් විශාල ප්‍රමාණයක් වියළි කලාපයේ තියෙනවා. එබැවින් මෙම ගොවියෝ අසරණ දිළිඳු තත්ත්වයකට පත්වී සිටිනවා. එවැනි තත්ත්වයක් යටතේ දුළු ගොවියා නගා සිටුවීමට රජයේ අනුග්‍රහය ලබාදීමට සිදුවී තිබෙනවා. මෙතැනදී රජයේ අනුග්‍රහය මගින් ඔවුන්ට අවශ්‍ය කරන්නේ ඔවුන් මුහුණපා සිටින ජල හිඟතාවය පිළිබඳ ප්‍රශ්නයට යම් විසඳුමක් ලබාගැනීමයි. ඒ සඳහා ඇති එක් විකල්පයක් වශයෙන් රජය වගා ළිං ක්‍රමය හඳුන්වා දුන්නා. මෙතෙක් භාවිතයට නොගත් භූගත ජලය මෙම ගොවියාට ලබාදී, ඔවුන්ගේ අතහැර දැමූ ඉඩම් නැවත වගා කිරීමට එයින් අවස්ථාවක් ලබාකර දුන්නා.

මෙම වගා ළිං හේතුකොට ගෙන ගොවියාට කන්න දෙකම සාර්ථකව වගා කළ හැක. මීට අමතරව මැද කන්නයකට ඉඩ ප්‍රස්ථාව ඇති වූ අවස්ථාවකදී එම කන්නය ද වගා කිරීමට ගොවියාට අවශ්‍ය ජලය මෙම වගා ළිං මාර්ගයෙන් ලබා ගැනීමට අවස්ථාව ලැබෙනවා. එක් කන්නයක්වත් වගා කිරීමට නොහැකිව සිටි ගොවියාට අවශ්‍ය නම් කන්න තුනක්ම වගා කිරීමේ අවස්ථාව මතුවීමෙන් ඔහුගේ සමාජ හා ආර්ථික තත්ත්වය වැඩිදියුණු වන බව පැහැදිලියි.

**ප්‍රශ්නය :** **මෙම වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය සම්බන්ධව ඔබතුමාගේ අදහස් දක්වන්න.**

**පිළිතුර :** 88/89 අනුරාධපුරයෙන් ආරම්භ වූ වගා ළිං වැඩ සටහන මේ වනවිට වගා ළිං 12,000 පමණ ශ්‍රී ලංකාවේ සෑම වියළි කලාපීය දිස්ත්‍රික්කයකම පාහේ සාදා ඇත. මින් වැඩි ප්‍රමාණයක් අනුරාධපුර, හම්බන්තොට, කුරුණෑගල, මොණරාගල වැනි දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත වූ අතර අනෙක් දිස්ත්‍රික්කවල ද පැතිරී ඇත. අවම වශයෙන් එක් ළිඳකින් අක්කර 2 ක් වගා කළ හැකිනම් මෙම වගා ළිං 12,000 නිසා අවම වශයෙන් අක්කර 30,000ක ඉඩම් ප්‍රමාණයක් කන්න දෙකම වගා කරන්න පුළුවන්.

**ප්‍රශ්නය :** **මෙම වැඩසටහනේ අනාගත වැඩපිළිවෙල කුමක්ද ?**

**පිළිතුර :** අනාගත වැඩපිළිවෙල වශයෙන් මෙම වැඩසටහන ඉදිරියට ගෙනයෑමත්, වසර 5 ක් තුළ වගා ළිං 50,000 දක්වා ව්‍යාප්ත කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

**ප්‍රශ්නය :** **මෙම කෘෂි ළිං සඳහා සියළුම ඉදිකිරීම් වියදම් රජය විසින් දරනවාද, නැත්නම් වෙනත් ආධාර යටතේ සිදු කරන ඒවාද ?**

**පිළිතුර :** මෙතෙක් ඉදිකර ඇති වගා ළිං ව්‍යාපෘතියේ සියළුම මුදල් රජය විසින් දරා ඇත. කෘෂි සංවර්ධන අධිකාරිය විසින් ඉදිරියට ගෙන යන මෙම වැටසටහනට රජයේ පූර්ණ සහයෝගය ලබාදී ඇත. කෙසේ වෙතත්, වෙනත් සංවර්ධන කටයුතු සඳහා ණය දෙන දේශීය/විදේශීය ආයතන ද මෙම ව්‍යාපෘතිය ඉදිරියට ව්‍යාප්ත කිරීමට රජය සමග සාකච්ඡා කොට ඇත. මේ සම්බන්ධයෙන් මෙතෙක් නිශ්චිත තීරණයක් ගෙන නොමැත. කෙසේ හෝ මෑත කාලයේ දී මේ ගැන තීරණයක් ගෙන වගා ළිං ව්‍යාපෘතිය තවදුරටත් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ හැරුණු විට සර්වෝදය මගින් ළිං 200 ක් ඉදිකිරීමට ගොවීන්ට ආධාර ලබාදී ඇත.

**ප්‍රශ්නය :** **ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමැතිවරයා වශයෙන් ඔබතුමා සිතන පරිදි කෘෂි ළිං සංකල්පය තුළින් වියළි කලාපයේ ගැමි ආර්ථිකය නංවාලිය හැකිද?**

**පිළිතුර :** ඔව්, ගල්ගමුව, හම්බන්තොට වැනි ප්‍රදේශවල දැනටමත් ගොවීන්ගේ ආර්ථික තත්ත්වය ටිකින් ටික දියුණුවෙමින් පවතිනවා. මම හිතනවා මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන ගියහොත් අන්ත දරිද්‍රතාවයෙන් පෙළී සිටින ගොවියාට මෙම විකල්පයෙන් දිළිඳුකමින් මිදීමට පිටුවහළක් විය හැකියි.

**ප්‍රශ්නය :** **කෘෂි ළිං වැටසටහන වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබාදී තිබෙන්නේ කුමන ප්‍රදේශවල ද ?**

**පිළිතුර :** මෙය වඩාත්ම සාර්ථක වී තිබෙන්නේ හම්බන්තොට, මොණරාගල, අනුරාධපුර, කුරුණෑගල වැනි වියළි කලාපීය දිස්ත්‍රික්ක වලයි. වියළි දේශ ගුණයෙන් වඩාත්ම පීඩිතව සිටින ගොවීන්ට මෙම කෘෂි ළිං ලබාදීමෙන් ඔවුන්ගේ වගා කටයුතු විශාල වශයෙන් සාර්ථක කර ගැනීමට ද හැකිවී තිබෙනවා.

**ප්‍රශ්නය :** **මෙවැනි ජාතික මට්ටමේ ව්‍යාපාරයක් කරන විට, උස්සාන වාරිමාර්ග ක්‍රම පිළිබඳව ගොවීන්ට පුහුණුවක් ලබාදීම වැනි වැඩපිළිවෙළක් තිබෙනවාද ?**

**පිළිතුර :** කෘෂි සංවර්ධන අධිකාරියෙන් කෙරීගෙන යන වගා ළිං ව්‍යාපාරයේදී බෝග නිෂ්පාදනය, පළිබෝධ නාශක භාවිතය, පොහොර භාවිතය පිළිබඳව ගොවියාට දැනටමත් පුහුණුවක් ලබාදී තිබෙනවා. මීට අමතරව ජල පොම්ප මෙහෙයවීම සහ නඩත්තුව පිළිබඳව ගොවි කණ්ඩායමකින් තෝරාගත් එක් ගොවියෙකු බැගින් පුහුණුව දී

8 පිටුවට ➪

## කෘෂිකාර්මික ළිං ඉදිකිරීමේ ....

7 පිටුවෙන්

තිබේ. මින් ඉදිරියට පුහුණු වැටසටහත් මීට වඩා විධිමත් ලෙස කිරීමට බලාපොරොත්තු වෙනවා.

**ප්‍රශ්නය : මෙම කෘෂි ළිං ඉදිකිරීම නිසා භූගත ජල මට්ටමට බලපෑමක් විය හැකියයි සමහරුන් පවසනවා. ඒ ගැන ඔබතුමාගේ අදහස් මොනවාද?**

පිළිතුර : කෘෂි ළිං වැනි විශාල පරිමාණයේ ව්‍යාපෘති ආරම්භ කරන විට ප්‍රශ්න ඇතිවේ යයි විද්‍යාඥයින් පෙන්වා දී තිබෙනවා. එම ප්‍රශ්නයට දැනට පිළිතුරක් දීමට නොහැකි වුවත්, මේ ගැන සොයා බැලීම සඳහා කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් පර්යේෂණ කණ්ඩායමක් යොදවා තිබෙනවා. ඒ අයගේ උපදෙස් අනුව මෙම වැඩසටහනේ ඉදිරි අනාගතය සැකසේ යයි බලාපොරොත්තු වෙනවා.

**ප්‍රශ්නය : මෙම වැඩපිළිවෙල ලංකාවේ වාරි කෘෂිකර්මයේ විශාල පෙරළියක් කිරීමට ප්‍රවනතාවයක් තිබෙන හෙයින් මේ පිළිබඳව පර්යේෂණ කිරීමට අවශ්‍ය මුදල් හා සම්පත් ලබාගැනීමට යම් වැඩපිළිවෙලක් සකස් වී තිබෙන්නේද?**

පිළිතුර : මෙවැනි පර්යේෂන සඳහා දැනට හඳුනාගත් වැඩපිළිවෙලක් නැතත් ගොවියාගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා කරනු ලබන පර්යේෂන සඳහා ධෛර්යය ලබාදීමට මම හැමවිටම කැපවී සිටිනවා.

*ආර්. ද එස්. ආරියබන්දු*
**සහ එච්. එම්. ජේ. කේ. හේරත්**